# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව
# அரசகரும மொழிகள் திணைக்களம்

## II වන මට්ටම - සිංහල
## மட்டம் II – சிங்களம்

### ආදර්ශ ප්‍රශ්න
### மாதிரி வினாக்கள்
### 1 කොටස
### பகுதி 1

---

විශේෂ සටහන

II වන මටටම **සිංහල භාෂාවට** අදාළ විෂය නිර්දේශය හා පෙළ පොත් ඇසුරින් සකසන ලද ආදර්ශ ප්‍රශ්න කිහිපයක් විභාග අපේක්ෂකයන් වන ඔබගේ පහසුව පිණිස ඉදිරිපත් කර ඇත.

விசேட குறிப்பு

II ஆம் மட்டம் சிங்கள மொழிக்கான பாடப்பரப்பிற்கும் பாடப்புத்தகத்திற்கும் அமைவாக தயாரிக்கப்பட்ட மாதிரி வினாக்கள் சிலவற்றை பரீட்சார்த்திகளின் வசதிக்காக முன்வைக்கப்பட்டுள்ளது.

01. වරහන් තුළ ඇති අකුරු යොදා අර්ථවත් වාක්‍යයක් සැකසෙන පරිදි වචනය සම්පූර්ණ කරන්න.

i. ග ......... වේගයෙන් ගලයි.
   ග ........නගාමියා ගුවන් ගත විය. (ග , භ )

ii. නාගයා දර ............ ගසා සිටී.
   අංක පහ දර .......... ක්‍රීඩකයා නිමල් ය. (ණ , න )

iii. පාරේ වැඩ කර....... මිනිසුන් වෙහෙසට පත්ව සිටියි.
   වර්ෂාව කර....... කොටගෙන බොහෝ වැඩ කටයුතු අඩාල විය.(ණ , න )

02. පහත සඳහන් ඒකවචන පද බහු වචනයට හරවන්න.

i. කාර්යාලය ............................

ii. දරුවා ............................

iii. උගතා ...........................

03. පහත සඳහන් බහු වචන පද ඒක වචනයට හරවන්න.

i. සමනල්ලු .........................

ii. ගුරුවරු ...........................

04. පහත වාක්‍යවල හිස්තැනට සුදුසු යුගල පද වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(උඩ - බිම , ගමන් - බිමන් ,කැඩුම් - බිඳුම් , )

i. ................................ වෙදකමට දක්ෂ වෛද්‍යවරයෙක් අපේ ගමේ සිටී.

ii. ගුරුතුමිය ඇසූ ප්‍රශ්නයට සිසුවා ................................. බලමින් කල්පනා කළේය.

iii. වැඩකට නැති ................................. යාම නිසා සිරිපාලගේ කාලය නාස්ති වී ගියේ ය.

05. 1) පහත සඳහන් වේලාවන් අකුරින් ලියන්න.

i. 12.45 ........................................................................

ii. 10.50 ........................................................................

iii. 1.28 ........................................................................

2) පහත සඳහන් වේලාවන් ඉලක්කමෙන් ලියන්න.

i. විසිතුනයි විසිතුන ....................................................................

ii. තුනයි තිස්පහ ....................................................................

iii. හයයි හතළිහ ....................................................................

06. 1) ඉලක්කමෙන් දී ඇති සංඛ්‍යා අකුරින් ලියන්න.

i. 475 - ............................................................................................

ii. 598 -............................................................................................

iii. 1236 -.........................................................................................

2) අකුරින් දී ඇති සංඛ්‍යා ඉලක්කමෙන් ලියන්න.

i. එකසිය අනූ නවය .........................................................................

ii. පන්සිය හැට හත ..........................................................................

iii. හත්සිය හැත්තෑ හත ...................................................................

07. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. කොමසාරිස්තුමා ................................... හමුවීය. ( නිලධාරීන් / නිලධාරියෝ)

ii. සංවර්ධන නිලධාරියා .............................. දැනුවත් කරයි. (ගම්වැසියෝ /ගම්වැසියන් )

iii. පරිපාලන නිලධාරී ද මම ද වැඩසටහනට සහභාගී ......................... (වුණෙමු / වුණෙමි)

08. 1) පහත සඳහන් සිංහල වචන දෙමළ වචනයට හරවා ලියන්න.

i. කාර්යය ............................
ii. මැතිවරණය ...........................
iii. ජනමාධ්‍ය ...........................

2) පහත සඳහන් දෙමළ වචන සිංහලට හරවා ලියන්න.

i. பருவங்கள் .........................
ii. இசைக்கலைஞர் .........................
iii. மா உருண்டை .........................

09. පහත දැක්වෙන වාක්‍ය ලිඛිත භාෂාවෙන් ලියන්න.

i. මම නිතර කෝවිලට යනවා.

...........................................................................................................

ii. හවස 4.15ට රජයේ කාර්යාල වහනවා.

...........................................................................................................

10. හිස්තැනට ගැලපෙන වචනය වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කරන්න.

(අඟහරුවාදා , ලබන සතියේ, උදෑසන , හෙටට , මේ සතියේ )

නව වසර වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුමක් සකස් කිරීමේ අවශ්‍යතාව නිසා කාර්ය මණ්ඩලයේ සියලු දෙනා යුහුසුලුව ක්‍රියාත්මක විය. කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි (1)........................... රැස්වීම යොදා ගැනීමට තීරණය කරන ලදී. (2) ................... එම කාර්යයට අවශ්‍ය ඉඩ ප්‍රස්තාව නොතිබූ බැවින් වැඩසටහන කල් දැමීමට අපට සිදුවිය. ඒ හේතුවෙන් එන (3) ........................... සමස්ත කාර්ය මණ්ඩලයේම රැස්වීමක් පැවැත්වීමට මාණ්ඩලික නිලධාරීන් සැලසුම් කරන ලදී. නමුත් අඟහරුවාදා (4) ................................ ලැබුණු හදිසි පණිවිඩයක් නිසා

රැස්වීම (5) ......................................... කල් දමන ලද බව සෑම අංශයන් වෙතම දැනුම් දෙන ලදී.

# රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

## II වන මට්ටම - සිංහල

### පිළිතුරු

---

1. වරහන් තුළ ඇති අකුරු යොදා අර්ථවත් වාක්‍යයක් සැකසෙන පරිදි වචනය සම්පූර්ණ කරන්න.

   i. ගඟ වේගයෙන් ගලයි.
   ගගනගාමියා ගුවන් ගත විය. (ග , ඟ )

   ii. නාගයා දරන ගසා සිටී.
   අංක පහ දරණ ක්‍රීඩකයා නිමල් ය. (ණ , න )

   iii. පාරේ වැඩ කරන මිනිසුන් වෙහෙසට පත්ව සිටියි.
   වර්ෂාව කරණ කොටගෙන බොහෝ වැඩ කටයුතු අඩාල විය.(ණ , න )

2. පහත සඳහන් ඒකවචන පද බහු වචනයට හරවන්න.

   i. කාර්යාලය - කාර්යාල
   ii. දරුවා - දරුවෝ
   iii. උගතා - උගත්තු

3. පහත සඳහන් බහු වචන පද ඒක වචනයට හරවන්න.

   i. සමනල්ලු - සමනලයා

ii. ගුරුවරු - ගුරුවරයා

4. පහත වාක්‍යවල හිස්තැනට සුදුසු යුගල පද වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

i. කැඩුම් - බිඳුම් වෙදකමට දක්ෂ වෛද්‍යවරයෙක් අපේ ගමේ සිටී.

ii. ගුරුතුමිය ඇසූ ප්‍රශ්නයට සිසුවා උඩ - බිම බලමින් කල්පනා කළේය.

iii. වැඩකට නැති ගමන් - බිමන් යාම නිසා සිරිපාලගේ කාලය නාස්ති වී ගියේ ය.

5. 1) පහත සඳහන් වේලාවන් අකුරින් ලියන්න.

i. 12.45 දොළහයි හතළිස් පහයි / දොළහ පසුවී විනාඩි හතළිස් පහයි

ii. 10.50 දහයයි පනහයි / දහය පසුවී විනාඩි පනහයි

iii. 1.28 එකයි විසි අටයි / එක පසුවී විනාඩි විසි අටයි

2) පහත සඳහන් වේලාවන් ඉලක්කමෙන් ලියන්න.

i. විසිතුනයි විසිතුන 23.23

ii. තුනයි තිස්පහ 3.35

iii. හයයි හතළිහ 6.40

6. 1) ඉලක්කමෙන් දී ඇති සංඛ්‍යා අකුරින් ලියන්න.

i. 475 - හාරසිය හැත්තෑ පහ

ii. 598 - පන්සිය අනූ අට

iii. 1236 - එක්දහස් දෙසිය තිස් හය

2) අකුරින් දී ඇති සංඛ්‍යා ඉලක්කමෙන් ලියන්න.

i. එකසිය අනූ නවය - 199

ii. පන්සිය හැට හත - 567

iii. හත්සිය හැත්තෑ හත - 777

7. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. කොමසාරිස්තුමා නිලධාරීන් හමුවීය. ( නිලධාරීන් / නිලධාරියෝ)

ii. සංවර්ධන නිලධාරියා ගම්වැසියන් දැනුවත් කරයි. (ගම්වැසියෝ / ගම්වැසියන්)

iii. පරිපාලන නිලධාරී ද මම ද වැඩසටහනට සහභාගී වුණෙමු (වුණෙමු / වුණෙමි)

8. 1) පහත සඳහන් සිංහල වචන දෙමළ වචනයට හරවා ලියන්න.

i. කාර්යය பணி

ii. මැතිවරණය தேர்தல்

iii. ජනමාධ්‍ය ஊடகம்

2) පහත සඳහන් දෙමළ වචන සිංහලට හරවා ලියන්න.

1. பருவங்கள் ඍතු
2. இசைக்கலைஞர் සංගීතඥ
3. மா உருண்டை අග්ගල

9. පහත දැක්වෙන වාක්‍ය ලිඛිත භාෂාවෙන් ලියන්න.

1. මම නිතර කෝවිලට යනවා.
   මම නිතර කෝවිලට යන්නෙමි.

2. හවස 4.15ට රජයේ කාර්යාල වහනවා.
   හවස 4.15ට රජයේ කාර්යාල වසයි.

10. හිස්තැනට ගැලපෙන වචනය වරහන් තුළින් තෝරා ඡේදය සම්පූර්ණ කරන්න.

(අඟහරුවාදා , ලබන සතියේ, උදැසන , හෙටට , මේ සතියේ )

නව වසර වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුමක් සකස් කිරීමේ අවශ්‍යතාව නිසා කාර්ය මණ්ඩලයේ සියලු දෙනා යුහුසුලුව ක්‍රියාත්මක විය. කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි (1) .......... ලබන සතියේ........ රැස්වීමක් යොදා ගැනීමට තීරණය කරන ලදී. (2) ... මේ සතියේ........... එම කාර්යයට අවශ්‍ය ඉඩ ප්‍රස්තාව නොතිබූ බැවින් වැඩසටහන කල් දැමීමට අපට සිදුවිය. ඒ හේතුවෙන් එන (3) ..අඟහරුවාදා...... සමස්ත කාර්ය මණ්ඩලයේම රැස්වීමක් පැවැත්වීමට මාණ්ඩලික නිලධාරීන් සැලසුම් කරන ලදී. නමුත් අඟහරුවාදා (4) .............උදැසන.......... ලැබුණු හදිසි පණිවිඩයක් නිසා රැස්වීම (5) ........හෙටට........ කල් දමන ලද බව සැම අංශයන් වෙතම දැනුම් දෙන ලදී.

# II වන මට්ටම - සිංහල
# மட்டம் II – சிங்களம்

## ආදර්ශ ප්‍රශ්න
## மாதிரி வினாக்கள்

## 2 කොටස
## பகுதி 2

01. දී ඇති මාතෘකාවක් යටතේ වචන 100කට නොඅඩු රචනයක් ලිවීම.

    උදා: රූපවාහිනිය හා ළමා පරපුර

02. ලේඛනයකින් උපුටා ගත් ඡේදයක හිස්තැන් පිරවීම.

03. වරහන් තුළ දී ඇති වචන යොදා ගෙන ඡේදයේ හිස්තැන් පිරවීම..

04. සිංහල භාෂාවෙන් දෙන ලද වාක්‍ය දෙමළ බසට හැරවීම.

05. දෙමළ භාෂාවෙන් දෙන ලද වාක්‍ය සිංහල බසට හැරවීම.

06. දෙන ලද ඡේදයක් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම.

07. රාජකාරී ලිපියක් ලිවීම.

08. පෞද්ගලික ලිපියක් ලිවීම.

09. දෙන ලද පාඨයක් තනි වාක්‍යයකින් ලිවීම.

10. දෙන ලද විස්තරයක් ඇසුරින් දැන්වීමක් පිළියෙල කිරීම.

මේ ආකාරයේ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඔබ වෙත ඉදිරිපත් වීමට ඉඩ ඇත.

ඔබගේ පුහුණුවට හා මඟ පෙන්වීමට සහයක් ලෙස මෙම කරුණු ඉදිරිපත් කර ඇත.